දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E - mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
## அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
## OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

මගේ අංකය
எனது இல.
My No.
PSC/APP/11/5/7/2022

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
2023 පෙබරවාරි මස ០២. වන දින

---

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 02/2022(I)

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

<u>රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත්කිරීම් බලධරයා වන දීපව්‍යාප්ත සේවාවල හා අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල විධායක සේවා ගණවල I ශ්‍රේණියේ තනතුරු සඳහා නිලධාරීන් තෝරාගැනීමේ පටිපාටිය (පූර්ණකාලීන පදනම මත රාජකාරී ඉටුකිරීමේ පත්කිරීම් සඳහා ද ඇතුළුව)</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 02/2022 දරන හා 2022.09.15 දිනැති චක්‍රලේඛයේ විධිවිධාන පහත ආකාරයේ පත්කිරීම්වලට ද අදාළ නොවිය යුතු බවට එම කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.

I. සේවා අවශ්‍යතාව මත අදාළ පරිපාලන බලධරයා විසින් දීප ව්‍යාප්ත සේවාවක I ශ්‍රේණියේ පහත දැක්වෙන කාණ්ඩවලට අයත් නිලධාරීන් උපරිම මාස 03ක කාලයක් සඳහා වලංගු වන පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභා ආවරණ අනුමැතියට යටත්ව එම සේවයේ I ශ්‍රේණියේ තනතුරුවල පූර්ණකාලීනව වැඩබැලීම සඳහා පත්කිරීම්

(අ) තාවකාලිකව මුදාහරිනු ලැබ ඇති රාජ්‍ය සේවයෙන් බැහැර තනතුරුවලින් ආපසු රාජ්‍ය සේවයට එවනු ලබන නිලධාරීන්

(ආ) සේවා අවශ්‍යතාවය මත දැනට දරන තනතුරුවලින් පිටතට ස්ථානමාරු කරනු ලබන හා ප්‍රියමනාප සේවා ස්ථානවල නියමිත උපරිම සේවා කාලය සම්පූර්ණ කරනු ලබන නිලධාරීන්

II. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු තුළ දීප ව්‍යාප්ත සේවා සහ විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගේ අභ්‍යන්තර මාරුවීම්

02. තවද, චක්‍රලේඛයේ සඳහන් "I ශ්‍රේණිය" යන්නට දීප ව්‍යාප්ත සේවාවල හෝ විධායක සේවා ගණවල වෙනස් ලෙස නම් කර ඇති සමාන්තර ශ්‍රේණි ද ඇතුළත් විය යුතු බව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වැඩිදුරටත් තීරණය කර ඇත.

03. මෙම චක්‍රලේඛ සංශෝධනය 2023.02.02 දින සිට ක්‍රියාත්මක වේ.

තනුජා මුරුගේෂන්
වැඩ බලන ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව